<u>අභ්‍යන්තර චක්‍රලේඛ - 02 / 2017</u>

මගේ අංකය : **SSD/02/10/08/01**
සමාජ සේවා දෙපාර්තමේන්තුව
II අදියර
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල
**2017.03.**

දිස්ත්‍රික් ලේකම්
ප්‍රාදේශීය ලේකම්,

රෝහල් අධ්‍යක්ෂ,
අධිකාරි,
ස්ථානභාර නිලධාරී,
ආයතන ප්‍රධානීන්.

**<u>සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරි I හා II ශ්‍රේණීවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017</u>**

**1.0** සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන් සඳහා **2011.11.30** දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සමාජ සේවා නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **I** හා **II** විභාග කොමසාරිස් ජනරාල් විසින් **2017** ජුලි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**2.0 I** හා **II** ශ්‍රේණිවල සමාජ සේවා නිලධාරින් සඳහා මෙම විභාගය කොළඹ දී පැවැත්වේ.

**3.0**

i. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ.
ii. විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති මෙහි සඳහන් නීති උල්ලංඝණය කලහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත

**4.0** සුදුසුකම් - සමාජ සේවා නිලධාරි තනතුරේ II ශ්‍රේණියට පත් වී ඇති නිලධාරීන් **1** වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට ද I ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන් **2** වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට ද ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

**5.0** අයදුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම් පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2017** අප්‍රේල් මස **24** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්,සංවිධාන හා විදේශ විභාග ශාඛාව,ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,තැ.පෙ. **1503,** කොළඹ", යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය.

**6.0** අපේක්ෂකයින්ගේ අනන්‍යතාව

අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**7.0** අයදුම් පත්‍ර - ආදර්ශ අයදුම් පත්‍රයේ අංක 1.0 සිට 4.0 තෙක් ශීර්ෂ පළමු වන පිටුවට ද අංක 5.0 සිට 9.0 තෙක් ශීර්ෂ 2 වන පිටුවට ද ඉතිරිය 3.0 වන පිටුවට ද ඇතුළත් වන පරිදි "ඒ4" ප්‍රමාණයේ කඩදාසි වල අයදුම් පත්‍රය පිළියෙල කල යුතුය. අයදුම් පත්‍රය තමා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කල යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍ර වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර,එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම් පතක් පමණි තව ද අයදුම්පතේ ඡායා පිටපත් නො එවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

සටහන - "අයදුම්පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ".

**8.0** මෙම පරීක්ෂණයට පළමුවරට පෙනී සිටීමේ දී ගාස්තු අයකිරීමක් සිදු නොකරන අතර, සෙසු අවස්ථාවලදී සමස්ත විභාගයට රු. 500.00 ක්ද, එක් විෂයයක් සඳහා රු. 250.00 බැගින් ද වනසේ විභාග ගාස්තු අය කරනු ලැබේ. අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003 – 02 – 13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑ ම තැපැල් කාර්යාලයක් / උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. තව ද විභාග ගාස්තුව සඳහා මුදල් ඇනවුම හෝ මුද්දර භාරගනු නොලබන අතර,විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ. විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

සටහන - මෙම පරීක්ෂණය විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන පළමු වන අවස්ථාව මෙය බැවින් මෙම වතාවේදී පමණක් විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.

**9.0** විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පල කරනු ඇත. නිවේදනය පලවී දින **02** ක් හෝ **03** ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම,ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්,එම විස්තරය සමඟ,ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයන්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරිම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත / විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

සටහන : අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු / ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

**10.0** මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පැවැත්වේ. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා ඉදිරිපත් වූ මාධ්‍ය භාෂා මාධ්‍ය ලෙස තෝරා ගත යුතුය.

**10.1** අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු / විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු , සාමදාන විනිශ්චයකාරවරයෙකු,දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. **240,360/-** ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමින් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**10.2** විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

**10.3** විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහු හෝ ඇයට සිදුවනු ඇත.

**11.0** අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා පරික්ෂණය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා යටත් පිරිසෙයින් ලකුණු **40%** ක ප්‍රමාණයක් ලබාගත යුතුය. අපේක්ෂකයෙකුට එක් අවස්ථාවක දී එක් විෂයකට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට පෙනී සිට සමත් විය හැකිය.

**12.0** විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනයක් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙනු ඇත.

**13.0** නිලධාරියෙකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා වලදී හෝ පෙනී සිටිය හැක.

අදාළ විභාග පරිපාටිය - <u>පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u>

- i. විෂයය අංක 1 - කාර්යාල ක්‍රම - ලකුණු 100 - කාලය පැය 02
- ii. විෂයය අංක 2 - ගිණුම් ක්‍රම - ලකුණු 100 - කාලය පැය 01
- iii. විෂයය අංක 3 - සමාජ සුභසාධන ප්‍රතිපත්ති හා පරිපාලනය - ලකුණු 100 - කාලය පැය 01

විෂය නිර්දේශය

i. කාර්යාල ක්‍රම

ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ

- II - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි හා පත්කිරීම්
- VII - වැටුප්
- VIII - අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා
- XII - නිවාඩු
- XIII - දුම්රිය බලපත්‍ර
- XIV - දිවයින ඇතුළත රාජකාරි ගමන්
- XV - අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම
- XVI - නිවාඩු ගමන්
- XVII - අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර
- XVIII - නිල නිවාස
- XXIV - වැටුප් ණය අත්තිකාරම්
- XXV - වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහ
- XXX - රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල
- XXXI - සමිති සමාගම් පවත්වාගෙන යාමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් භුක්ති විඳිම

ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ

- XLVII - සාමාන්‍ය හැසිරීම හා විනය
- XLVIII - විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීතී

ii. ගිණුම් ක්‍රම

ගණන් දීමේ නිලධාරීන් (මු.රෙ.124, 125, 127, 128, 135)

රාජ්‍ය මුදල් ලැබීම් XI පරිච්ඡේදය

ආණ්ඩුවේ මුදල් යනාදිය ආරක්ෂාව (මු.රෙ. VI පරිච්ඡේදය)

රජයේ දෙපාර්තමේන්තු වල ප්‍රධාන පොත් හා ලේඛන (මු.රෙ.XII පරිච්ඡේදයේ II කොටස)

මිලදී ගැනීමේ මූලධර්ම හා විධිවිධාන

**iii.** සමාජ සුභසාධන ප්‍රතිපත්ති හා පරිපාලනය

මූලික සමාජ වැඩ ක්‍රම

සමාජ සේවය, සමාජ සුභසාධනය, සමාජ සංවර්ධනය සහ පුනරුත්ථාපනය

සමාජ සුභසාධන කටයුතුවලට අදාළ අනපනත්

සමාජ සුභසාධන ප්‍රතිපත්ති, කාර්යයන් සහ එහි වැදගත්කම

සමාජ සුභසාධන පරිපාලන මූලධර්ම හා කාර්යයන්

<u>දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

**i.** විෂයය අංක **1** - ආර්ථික විද්‍යාව - ලකුණු **100** - කාලය පැය **1 ½**

**ii.** විෂයය අංක **2** - සමාජ විද්‍යාව - ලකුණු **100** - කාලය පැය **1 ½**

**iii.** විෂයය අංක **3** - මනෝ විද්‍යාව - ලකුණු **100** - කාලය පැය **1 ½**

විෂය නිර්දේශය

**i.** ආර්ථික විද්‍යාව

ආර්ථික විද්‍යාව හැඳින්වීම, නිෂ්පාදන හා පිරිවැය න්‍යායන්, උපේක්ෂා පත්‍ර විග්‍රහය, වෙළඳපළ ව්‍යුහය සහ වෙළඳපළ ආකෘති, හීනවන ආන්තික ඵලදා න්‍යාය සහ පරමාණුකඵල පිළිබඳ න්‍යාය, මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්තීන්, ජාතික ආදායමේ වෘත්තාකාර ප්‍රවේශය, උද්ධමනය හා සේවා වියුක්තිය, විවෘත ආර්ථික සාර්ව ප්‍රතිපත්ති

**ii.** සමාජ විද්‍යාව

සමාජ විද්‍යාවේ න්‍යාය, මූලධර්ම හා පර්යේෂණ ක්‍රම, සමාජ විෂමතා සහ සමාජ ගැටලු, සමාජානුයෝජනය හා සමාජ ස්ථරායන ක්‍රම, පවුල් සංස්ථා හා අන්තර් සබඳතා

**iii.** මනෝවිද්‍යාව

සාමාන්‍ය මනෝ විද්‍යාව, සමාජ මනෝ විද්‍යාව, ළමා මනෝ විද්‍යාව, වැඩිහිටි හා ආබාධිත පුද්ගලයන් සඳහා උපදේශනය

**14.0** මෙම විභාග නිවේදනය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පලවන බැවින් එහි භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැලකිය යුතුය.තව ද මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව සමාජ සේවා අධ්‍යක්ෂගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

**2017** 30 මස 21

සෙත්සිරිපාය, **II** වන අදියර,

**2** වන මහළ

බත්තරමුල්ල

ප්‍රදීප් යසරත්න

සමාජ සේවා අධ්‍යක්ෂ

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ආදර්ශ අයදුම් පත්‍රය

සමාජ සේවා නිලධාරි I හා II තනතුරු සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2017

**Efficiency Bar Examination of Social Services Officer's I and II - 2017**

**(මෙම විභාග නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන්නේ මධ්‍යම රජයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් සමාජ සේවා නිලධාරි I හා II පංති වල නිලධාරීන්ට පමණි.)**

ඉල්ලුම් කරනු ලබන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - I II
( අදාළ කොටුව තුළ x යොදන්න)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

---

**1.0**

**1.1** සම්පූර්ණ නම : ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා: **(HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)** :.........................................................................................

**1.2** අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම් වල මුලකුරු පසුව ද යොදා නම : ..............................................
(උදා : **(GUNAWARDHANA H.M.S.K)**
:.........................................................................................

**1.3** සම්පූර්ණ නම : ..........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)
..........................................................................................

**2.0** සේවා ස්ථානයේ ලිපිනය

**2.1** කාර්යාලයේ /දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය : ..............................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..........................................................................................

**2.2** කාර්යාලයේ /දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය : ..............................................................
(සිංහලෙන් / දෙමළෙන්)
:.........................................................................................

**2.3** විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :.........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..........................................................................................

**3.0** ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - 1
(අදාල අංකය කොටුව තුළ ලියන්න ) පුරුෂ - 0

**4.0** ජාතික හැඳුනුම්පත් අංකය :

**5.0** දුරකථන අංක

**5.1** රාජකාරි :

|  |  |  |  |  |  |  |  |  |  |
|---|---|---|---|---|---|---|---|---|---|

**5.2.** පෞද්ගලික :

|  |  |  |  |  |  |  |  |  |  |
|---|---|---|---|---|---|---|---|---|---|

**6.0** මුල් පත්වීම් දිනය වර්ෂය |  |  |  |  | මාසය |  |  | දිනය |  |  |

**7.0** පත්වීම ස්ථිර කර ඇත්නම් ස්ථිර කළ දිනය :

වර්ෂය |  |  |  |  | මාසය |  |  | දිනය |  |  |

**8.0** මීට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර

පෙනී සිටි කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය : **I, II** ☐

| විෂය අංකය | විෂය | සාමාර්ථය | |
|---|---|---|---|
| | | සමත් | අසමත් |
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |

**9.0** ඉල්ලුම් කරනු ලබන විෂයය / විෂයයන් :

| විෂය අංකය | විෂය |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |

**10.0** විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

**(i )** විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ..........................................................

**(ii )** ලදුපත් අංකය හා දිනය : ..........................................................

**(iii )** ගෙවූ මුදල : ..........................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න.<br>( ලදුපතේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය ) |

**11.0** අයදුම්කරුගේ ප්‍රකාශය:

ඉහත සඳහන් විස්තර නිවරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයන් විභාග කොමසාරිස් ජනරාල් වරයා විසින් ගනු ලබන තීරණ වලට හා විභාග පනතේ සියළු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය : ..............................................  ..................................................

අපේක්ෂකයාගේ / අපේක්ෂිකාවගේ අත්සන

සටහන :

තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ........................................................................... මහතා/ මහත්මිය/මෙනවිය ....................................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් ඔහු/ ඇය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන අයකු බවත් මෙම විභාගය සඳහා සහභාගී වීමට ඔහු/ඇය සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

..................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / බලයලත්

නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව

නම : ..........................................................

පදවි නාමය : ..........................................................

ලිපිනය : ..........................................................

දිනය : ..........................................................